කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2011
2013 මැයි - අගෝස්තු

සමාජීය විද්‍යා පීඨය

පුරාවිද්‍යාව - **ARCH - E 1015**

පුරාවිද්‍යාවේ ඉතිහාසය

පුශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. පුරාවිද්‍යාව යනු කුමක්දැයි නිර්වචනය කර එහි අරමුණු සහ කාර්යයන් පැහැදිලි කරන්න.

02. පුරාවිද්‍යා විෂය වෙනත් විෂය ක්ෂේත්‍ර සමඟ දක්වන සම්බන්ධතාව විස්තර කරන්න.

03. "පුරාවිද්‍යා විෂයේ වර්ධනය අවධි කිහිපයකට බෙදිය හැක." විමසන්න.

04. අනුරාධපුර, පොළොන්නරුව සහ සීගිරිය යන ස්ථානවල මුල්කාලීන පුරාවිද්‍යා පර්යේෂණ පිළිබඳව කරුණු දක්වන්න.

05. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පර්යේෂණ ඉතිහාසය සමාලෝචනය කරන්න.

06. ලෝක උරුම සංකල්පය පැහැදිලි කොට සංස්කෘතික ස්මාරකයක් ලෝක උරුමයක් ලෙස නම් කිරීමට තිබිය යුතු මූලික සුදුසුකම් මොනවාදැයි නිදසුන් සහිතව පෙන්වා දෙන්න.

07. පුරාවස්තුවල ආරක්ෂාව සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීතිය පුරාවිද්‍යා ආඥා පනත ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පර්යේෂණ කටයුතු සිදුකරනු ලබන රාජ්‍ය ආයතනයක සංවිධාන ව්‍යුහය පිළිබඳව කරුණු දක්වන්න.

09. ඊජිප්තු ශිෂ්ටාචාරයේ කරන ලද කැණීම් ආශ්‍රයෙන් එකල සමාජය පිළිබඳව හෙළිදරව් වී ඇති කරුණු පරීක්ෂා කරන්න.

10. මතු දැක්වෙන මාතෘකා අතරින් <u>දෙකක් (02)</u> පිළිබඳ ප්‍රමාණවත් විස්තර ඉදිරිපත් කරන්න.
    1. මෙසපොතේමියාවේ නටඹුන්
    2. මහාචාර්ය සෙනරත් පරණවිතානගේ පුරාවිද්‍යා පර්යේෂණ
    3. මිහින්තලේ නටඹුන්
    4. ඇලෙක්සැන්ඩර් කණිංහැම්ගේ පුරාවිද්‍යා පර්යේෂණ

**************************